පාකිස්තානයේ සියල්කොට් හිදී ශ්‍රී ලාංකිකයෙකු ඝාතනය වීමේ සිදුවීම සම්බන්ධයෙන් මාධ්‍ය තුළ පුළුල් ආවරණයක් දක්නට ලැබිණි. ඒ අතර, ඇතැම් මාධ්‍ය තුළ එම ඝාතනය වූ ශ්‍රී ලාංකිකයාගේ දරුවන් සහ බිරිඳ ඇතුළු පවුලේ ඡායාරූපයන්, ඔවුන්ගේ අනන්‍යතාවයන් ඉස්මතු වන ආකාරයෙන් ඉදිරිපත් වී තිබෙනු දක්නට ලැබිණි.

දෙසැම්බර් 06 මව්බිම පුවත්පතේ මුල් පිටුවේ ඔවුන් මුඛ ආවරණ පැළඳ සිටින ඡායාරූපයක් සමගින් දරුවන්ගේ නම් සහ ඔවුන්ගේ පාසැලේ නම පළවී තිබිණි. එසේම දෙසැම්බර් 06 දිනමිණ පුවත්පතේ දරුවන්ගේ පාසැලේ නම පළවී තිබිණි.

1) මෙම සිදුවීම වාර්තා කිරීමේදී ඝාතනය වූ අයගේ දරුවන් ඇතුළු පවුලේ අයගේ ඡායාරූප පළ කිරීම අවශ්‍ය වන්නේද?

2) එසේ එම ඡායාරූප පළ කිරීම ඔස්සේ ඔහුගේ දරුවන් ඇතුළු පවුලේ අයට වැඩිමනත් සිත්වේදනාවන් සහ අනවශ්‍ය පීඩාවන් සිදු නොවනු ඇති ද?

3) මෙම සිදුවීමට ලැබුණු පුළුල් අවධානය සමගින් විශේෂයෙන්ම දරුවන්ගේ අනන්‍යතාවයන් නිරාවරණය කිරීම සහ, ඔවුන්ව ඉස්මතු කොට දැක්වීම ඔස්සේ, එම දරුවන්ගේ පාසැල් අධ්‍යාපනයට පවා බාධා නොපැමිණේ යැයි අපට සහතික විය හැකිද?

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?